14. ඒ ආකාරයට ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවල අවශ්‍යතාවන් සඳහා "යටිතල පහසුකම්" සැලසුවද මහජන විරෝධය නිසා අදාළ ක්‍රියාවලිය ඔවුන්ට අවශ්‍ය ආකාරයට කාර්යක්ෂමව ඉදිරියට ගෙනයාමට නොහැකි විය. ඒ අනුව ඊට අදාළව රාජ්‍යය සහ විශේෂයෙන්ම ආරක්ෂක හමුදා ප්‍රධානීන් බිය වැද්දීම සඳහා ජාත්‍යන්තර යුද අපරාධ යාන්ත්‍රණයක අවශ්‍යතාවය මානව හිමිකම් කවුන්සිලය තුළ සහ ඉන් පිටත දී අවධාරණය කෙරිණි. උදාහරණයක් ලෙස යස්මින් සූකාගේ ITJP සංවිධානය විසින් ඊට අදාළව චෝදනා පත්‍ර සකස් කළ අතර යම් රටවලදී අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා උත්සාහයන් ගනු ලැබීය. ඊට අමතරව විශේෂ ජාත්‍යන්තර අපරාධ අධිකරණයක් පිහිටුවීම මෙන්ම පවතින ජාත්‍යන්තර අපරාධ අධිකරණය යොදා ගැනීම පිළිබඳවද නිර්දේශ ඉදිරිපත් විය. අවසානයේදී එම ක්‍රියාවලියේ කූඨප්‍රාප්තිය ලෙස 2021 මානව හිමිකම් කවුන්සලේ 46 වැනි සැසිවාරයේදී 46/1 යෝජනාව මගින් යුද අපරාධවලට අදාළව සාක්ෂි සහ චෝදනා ගොනු කිරීමේ ජාත්‍යන්තර යාන්ත්‍රණය පිහිටුවනු ලැබීය.

15. ඒ අනුව මෙවර 60 වන සමුළුවේදී ශ්‍රී ලංකාවට එරෙහිව ගතයුතු පියවර පිළිබඳව නිර්දේශ ඇතුළත් මහ කොමසාරිස් වාර්තාවට සමගාමීව ජාත්‍යන්තර යුද අපරාධ චෝදනා සහ සාක්ෂි ගොනු කිරීමේ යාන්ත්‍රණයට අදාළ වාර්තාවද නිකුත් වනු ඇත. ඉන්පසුව එම චෝදනා සහ සාක්ෂි මත පදනම්ව විවිධ රටවල අභිචෝදකයින් මගින් එම රටවලදී ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා නිලධාරීන්ට එරෙහිව අපරාධ නඩු ගොනු කිරීමේ හැකියාව ලැබේ. එසේ නඩු පැවරීමට අදාළව රටවල් 29 ක අභිචෝදකයින් සමඟ සාකච්ඡා කර තිබෙන බව 2023 මහ කොමසාරිස් වාර්තාව මගින් එළිදරව් විය. එසේ වුවත් ශ්‍රී ලංකාවේ රජය 46/1, 51/1, සහ 57/1 යන යෝජනා නිල වශයෙන් ප්‍රතික්ෂේප කිරීම මගින් 30/1 යෝජනාවට කැමැත්තදීම මගින් ආරම්භ කළ සමස්ත ක්‍රියාවලිය සමඟ බැඳීමක් නොමැති බව ජාත්‍යන්තර ප්‍රජාවට දැනුම් දී ඇති බව විදේශ අමාත්‍යවරයා ලෙස ඔබතුමාට මතක් කළ යුතුවේ.

16. එසේ වුවත් මානව හිමිකම් මහ කොමසාරිස් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව නිකුත් කරන වාර්තා මගින් ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරි පියවරක් තබන බවට පවතින අතීත අත්දැකීම් සහ විශේෂයෙන්ම යුද අපරාධ චෝදනා ගොනු කිරීමේ ජාත්‍යන්තර යාන්ත්‍රණයේ අවසන් වාර්තාව නිකුත් වීම යන පණිවිඩ මගින් ඔබතුමා ඇතුළු ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මෙන්ම ආරක්ෂක හමුදාවල සේවයේ නියුක්ත සහ විශ්‍රාමික යම් පාර්ශ්ව බියවැද්දීමේ හැකියාව ලැබී ඇත. එම බිය වැද්දීම් තුළ ඔබතුමා පුවත්පත්වලට සඳහන් කර තිබූ ආකාරයට, ශ්‍රී ලංකාවට එරෙහිව මෘදු යෝජනාවක් ඉදිරිපත් කෙරෙන බවට ගොඩනැගෙන මතවාදයට අනුව ඊට සම අනුග්‍රහකත්වය දැක්වීම මගින් තවදුරටත් එහි භයානකකම අඩු කර ගත හැකි බවට මතවාදයක් තහවුරුවේ. ඒ මගින් ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවල අපේක්ෂා ඉටු කිරීමේ අනතුරක් මතුවන බව ඔබතුමාට ඉතා ඕනෑකමින් පෙන්වාදීමට කැමැත්තෙමු.

17. ඊට අමතරව මේ වන විට රට තුළ ආරම්භ වී ඇති ආරක්ෂක හමුදා ප්‍රධානීන් ව්‍යාජ චෝදනා යටතේ නඩු පවරමින් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම, ආරක්ෂක හමුදා පිරිස් බලය අඩු කිරීමට ක්‍රියා කිරීම, උතුරු සහ නැගෙනහිර කඳවුරු ආශ්‍රිත මාර්ග විවෘත කිරීම සහ ඉඩම් නිදහස් කිරීම මගින් ඒවා අනාරක්ෂිත කිරීම, එම ප්‍රදේශවල ගුවන් හමුදාව විසින් පාලනය කරන ගුවන් තොටුපළවල් සිවිල් ගුවන් තොටුපළවල් බවට පත්කිරීම මෙන්ම විශ්‍රාමික සහ ආබාධිත ආරක්ෂක හමුදා නිලධාරීන්ගේ දීමනා සහ වරප්‍රසාද කපා දැමීම ආදී ක්‍රියාකාරකම් රාශියක් මගින් ආරම්භ කර ඇති ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවලට හොඳ හිත පෙන්වීමේ ක්‍රියාවලිය මගින්ද ඒ ආකාරයට ශ්‍රී ලංකාවට එරෙහිව මෘදු යෝජනාවක් ලබා ගැනීමේ අපේක්ෂාව තහවුරු කෙරෙන බව ඔබතුමා පිළිගන්නවා ඇත.

18. එසේම ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේග විසින් සමූල ඝාතන චෝදනා එල්ල කරමින් විදේශීය රටවල සිදුකරන ක්‍රියාකාරකම් සහ දේශීයව සිදුකෙරෙන හර්තාල් ආදිය මගින් සිදුකරන බලපෑම මෙන්ම යම් බෙදුම්වාදී පාර්ශ්ව සමග පවතින සබඳතා හෝ එම බලවේග විසින් රට තුළ විදේශ විනිමය පොම්ප කිරීම මගින් ආර්ථික අර්බුදය සමනය කරනු ඇත යන ව්‍යාජ බලාපොරොත්තු ආදී බහු විධ හේතු මත යටත් වීමේ මනෝභාවයක් ගොඩනැගිය හැකි අතර ඊට අනුව අනුව යහපතක් අපේක්ෂා කරමින් ඊනියා මෘදු යෝජනාවට සම අනුග්‍රාහකත්වය ලබාදීමේ උවමනාව ස්වයංව සාධාරණීකරණය කර ගැනීමේ හැකියාව තිබෙන බව ඔබතුමාට පෙන්වා දිය යුතුය.

19. එම තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍යයට බරපතළ උභතෝකෝටිකයකට මුහුණ දීමට සිදුවන බව ඉතා පැහැදිලිය. ඒ අනුව එක් පැත්තකින් ජාත්‍යන්තර යුද අපරාධ චෝදනා විභාග කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවා ගැනීමේ අරමුණු සහිතව හෙවත් ඊට බිය වී ඊනියා මෘදු යෝජනාවට සම අනුග්‍රහය දැක්වීම මගින් ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවලට මෙතෙක් ඉටු කර ගත නොහැකි වූ කොන්දේසි ඉටු කිරීමට සිදුවේ. අනෙක් පැත්තෙන් එසේ යටත් වීම මගින් අදාළ කොන්දේසි වලට එකඟ වුවද එනම් තම දෑතින්ම තම ගෙලට තොණ්ඩුව දමා ගැනීමට එකඟවුවද ජාත්‍යන්තර යුද අපරාධ චෝදනා විභාග කිරීමේ ක්‍රියාවලිය එනම්, ජාත්‍යන්තර අධිකරණ බලය යටතේ විවිධ රටවල අභිචෝදකයින් විසින් එම රටවලදී ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගමන් කිරීම ය. ඒ අනුව දෙපැත්තකින් අනතුරට ගොදුරු වීමට සිදුවන තත්ත්වයක් ඇතිවිය හැකි බව ඔබතුමාට පෙන්වා දිය යුතුව ඇත.

20. ඒ අනුව ඔබතුමා සඳහන් කරන ඊනියා මෘදු යෝජනා මගින් වර්තමාන ආණ්ඩුවට බැඳීමක් ඇති කරවන ප්‍රධාන යෝජනා ත්‍රිත්වයක් සඳහා ඔබතුමාගේ එකඟතාවය ලබා ගැනීම ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේග වල අවසාන අපේක්ෂාව බව ඔබතුමාට පෙන්වාදීමට කැමැත්තෙමු. එම තත්වය තුළ ඔබතුමා මෙම වසරේ පෙබරවාරි මාසයේදී මානව හිමිකම් කවුන්සිලයේදී පොරොන්දු වූ ආකාරයට දැනටමත් ගැසට් කර ඇති සත්‍ය සෙවීමේ කොමිසම පනත සම්මත කිරීමේ අවශ්‍යතාවය ඊනියා මෘදු යෝජනාවලියට ඇතුල්විය හැක. දෙවැන්න, ඔබතුමා පසුගිය දිනවල පුවත්පත්වලට ප්‍රකාශ කළ ආකාරයට චෝදනා ගොණු කෙරෙන ආරක්ෂක හමුදා නිලධාරීන්ට එරෙහිව කඩිනමින් අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමට අදාළ නීතිය සම්මත කිරීමය. ඒ මගින් වෙනත් රටවල අභිචෝදකයින් සමඟ අපරාධ නඩු කටයුතුවලට අදාළව අන්‍යෝන්‍ය සහයෝගීතාවය කාර්යක්ෂම කිරීමද සිදුවේ. තුන්වැන්න පළාත් සභා මැතිවරණය පවත්වා පරිපාලන වශයෙන් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය තත්ත්වය නිර්මාණය කිරීමය. ප්‍රායෝගිකව ඒ සඳහා අවශ්‍ය වන්නේ උතුරු සහ නැගෙනහිර පළාත්වල මහ ඇමැතිවරුන්ට පක්ෂපාතී ආණ්ඩුකාරවරුන් පත්කර නිහඬව සිටීමය.

21. අවසාන වශයෙන් ඒ ආකාරයට නීතිමය රාමු 9ක් සහිත බෙදුම්වාදී නීතිමය රාමු ව්‍යුහයට මෙතෙක් එකතු කරගත් නොහැකි වූ නීති 2ක් හෙවත් ඉහත සඳහන් කළ ආකාරයට සත්‍ය සෙවීමේ කොමිසම නීතිය සහ අභිචෝදක කාර්යාල නීතිය සම්මත කිරීම් මගින් බෙදුම්වාදින්ගේ මනදොල සම්පූර්ණයෙන්ම පිනවීමේ අවසාන පාවාදීම සිදු කරනවාද නැද්ද යන්න ඔබට ඉදිරිපත් වන මූලික අභියෝගය බවට පත්වේ. දෙවැන්න ඉහත සඳහන් කළ ආකාරයට ජනාධිපතිවරුන් 7 දෙනෙකු විසින් නොකළ දේ කිරීම සඳහා වර්තමාන ජනාධිපතිවරයා පෙළඹවීම සඳහා 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට අදාළ පරිපාලනමය ක්‍රියාමාර්ග ගන්නා බවට පොරොන්දු වීම මගින් ශ්‍රී ලංකාව නම් වූ ඒකීය රාජ්‍යය මිහිදන් කිරීම සඳහා යොදා ගන්නා බහාලුමේ අවසන් ඇණය ගැසීමය.

22. එම පාවාදීමේ ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවලට වෙනත් අතුරු සාධක කිහිපයක් සම්පූර්ණ කර ගැනීමට ද අවස්ථාව ලැබෙන බව ඔබතුමා තේරුම් ගත යුතුය. ඒ අනුව සත්‍ය සෙවීමේ කොමිසම පනතේ අඩංගු භයානක ප්‍රතිපාදන ත්‍රිත්වය අතරින් බරපතළම ප්‍රතිපාදනය වන රට තුළ ජාත්‍යන්තර මැදිහත්වීමකට ඉඩ සැලසීමය. ඉතිරි දෙක මගින් එනම් සාක්ෂි ආඥා පනත අදාළ නොකිරීම මගින් ආරක්ෂක හමුදාවලට එරෙහිව අභූත චෝදනා කර්මාන්ත ශාලාවක් නිර්මාණය කිරීම සහ අණදීමේ වගකීමට අදාළව චෝදනා ගොනු කිරීම මගින් බලවත් දේශීය යුද අපරාධ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමය.

**ඒ අනුව දීර්ඝ වශයෙන් කරුණු දැක්වීම මගින් අප බලාපොරොත්තු වන්නේ බෙදුම්වාදයට එරෙහිව දහස් ගණනින් ජීවිත පූජා කළ පක්ෂයක උරුමය සහිත පුද්ගලයකු ලෙස සෘජුව හෝ වක්‍රව මෙම මහා ජාතික පාවාදීමේ ක්‍රියාවලියට එනම් බෙදුම්වාදී මාර්ග සිතියමේ අවසන් සැතපුම පසු කිරීම සඳහා පාවාඩ එළිමේ ක්‍රියාවලියට දායක නොවන ලෙස ඉතා ඕනෑකමින් සහ ගෞරවයෙන් ඉල්ලා සිටීමය.**

## ගරු අමාත්‍යතුමනි, යටත්වීම වෙනුවට කළ යුතු දේ සහ කළ හැකි දේ

**ඊට අමතරව වසර 2500කට අධික කාලයක් සම්බුද්ධ ශාසනය ප්‍රමුඛ මහා සභ්‍යත්වයක් සහිත ශ්‍රී ලංකාව නම් වූ රාජ්‍යයේ කුමන හෝ ඓතිහාසික වාසනා ගුණයක මහිමයෙන් ඔබතුමා සහ ජනාධිපතිවරයා ප්‍රමුඛ වර්තමාන ආණ්ඩුවට සිහිබුද්ධිය සහ දේශපාලන ධෛර්යය පහළ වුවහොත් යුද ජයග්‍රහණයෙන් පසුව මෙතෙක් කිසිදු ආණ්ඩුවක් විසින් සිදු නොකළ පහත සඳහන් කොන්දේසි ඉටු කිරීම මගින් ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවල ග්‍රහණයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාව ප්‍රමුඛ සමස්ත ශ්‍රී ලාංකික ජනතාව මෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍යය ගලවා ගැනීම සහ ජාතික සමගිය සහ සංහිඳියාව දීර්ඝකාලීනව ශක්තිමත් කිරීම සඳහා අවස්ථාව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමු.**

I. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා පද්ධතියක් ලෙස යුද අපරාධ සිදු නොකළ බවට සකස් කර ඇති ජාත්‍යන්තර විශේෂඥ වාර්තා 6ක් සහ සෙසු නීතිමය මෙන්ම කරුණුමය සාක්ෂි මත ස්වාභාවික යුක්තිය ඉටු ඉල්ලීමේ පදනම, එනම් චෝදනා එල්ලකළ විට පිළිතුරු බැඳීමේ අයිතිය ඉල්ලා සිටීම, මගින් මානව හිමිකම් කවුන්සිලය හමුවේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල නිර්දෝෂී භාවය ඔප්පු කිරීම.

II. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට එරෙහිව දියත් කර ඇති පළිගැනීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර නීතියට පටහැනි බවට සියදුම සාමාජික රටවලට කරුණු දැක්වීම.

III. බෙදුම්වාදය සාධාරණීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බහුතර සිංහල ජනතාවට එරෙහිව ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේග විසින් එල්ල කරනු ලබන අසාධාරණ චෝදනා, අනාගතයේදී එල්ල කිරීමට ඉඩ නොලැබෙන ආකාරයට සහ බෙදුම්වාදී, ජාතිවාදී සහ ආගම්වාදී සුළුතරයක් විසින් යටත් කරගෙන සිටින බහුතර පීඩිත සුළු ජන කොටස්වලට සාධාරණ ඉටු කිරීම සඳහා ජාතිකත්වය ආගම භාෂාව හෝ කුලය මත කිසිවෙකුට වෙනස්කම් සිදු නොවන බව සහතික කිරීම සඳහා නව අයිතිවාසිකම් පනතක් හඳුන්වා දීම සහ කුලවාදයට එරෙහිව පවතින සමාජ දුබලතාවයන් වැළැක්වීමේ පනත බලාත්මක කිරීම.

IV. බෙදුම්වාදයට ඉඩ සලසන වර්තමාන පළාත් සභා ක්‍රමය වෙනුවට පළාත් පාලන ආයතන නියෝජිතයින්ගේ සමුළුවක් ලෙස පළාත් සංවර්ධන සම්බන්ධීකරණ සභා පිහිටුවීම සඳහා ව්‍යවස්ථාමය සහ නීතිමය ප්‍රතිපාදන හඳුන්වාදීම මගින් පීඩිත ජනයාට රාජ්‍ය පාලනයට දායකවීම සඳහා අවස්ථාව නිර්මාණය කිරීම.

V. බෙදුම්වාදී යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව වාසය කරන උතුරු සහ නැගෙනහිර පළාත් සහ ඒ ආශ්‍රිත සෙසු ප්‍රදේශවල ජනතාව පසුගාමීත්වයෙන් ගලවා ගැනීම සඳහා රාජ්‍ය සේවා, ආර්ථික ඉඩ ප්‍රස්ථා, ණය පහසුකම් සහ වෘත්තිය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම මුල් කරගෙන වසර 5ක කාලයක් සඳහා උතුරු සහ නැගෙනහිර වශයෙන් සංවර්ධන අධිකාරි දෙකක් පිහිටුවීම. ඊට අදාළව අරමුදලක් පිහිටුවීම සහ ක්‍රියාකාරකම් සඳහා ආරක්ෂක හමුදා සාමාජිකයන් සිවිල් ඇඳුමින් සහභාගී කරගැනීම මෙන්ම දකුණේ බහුතර සිංහල ජනතාව ස්වෙච්ඡාවෙන් එම කටයුතු වලට සහභාගී වීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම මගින් උතුරු දකුණ මානසික පාලම ඉදිකිරීමට දායකවීම.

VI. උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීම සහ හින්දු කෝවිල් බවට පත්කිරීම මගින් ආගමික ගැටුම් නිර්මාණය කිරීම සහ ව්‍යාජ බෙදුම්වාදී මතවාද තහවුරු කිරීම සඳහා අන්තවාදී බලවේග විසින් ගනු ලබන උත්සාහය පරාජය කර ජාතික සමගිය සහ සංහිඳියාව ශක්තිමත් කිරීම මුල්කරගෙන පුරාවිද්‍යා ආඥාපනත සහ වනජීවී පනත, වන සංරක්ෂණ පනත සහ මහවැලි අධිකාරී පනත පූර්ණ ලෙස බලාත්මක කිරීම මගින් සියලුම සිද්ධස්ථාන ඓතිහාසික සාක්ෂි අනුව සංරක්ෂණය කිරීම සහ නීති විරෝධීව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වැළැක්වීම.

**මේ වගට, ඉදිරිපත් කිරීම,**

ආචාර්ය ගුණදාස අමරසේකර
කැඳවුම්කරු
ජාතික සංවිධාන එකමුතුව

**අනුමත කරන වගයි ගෝලීය සංසදය වෙනුවෙන්**

01. යසස් ධර්මදාස මහතා ලේකම් විධායක කමිටුව
02. සේනක රාජපක්‍ෂ මහතා සභාපති, පෝලන්තය
03. ලලිත් ප්‍රේමලාල් මහතා සභාපති, අයර්ලන්තය
04. ජයරාජ් පළිහවඩන මහතා ලේකම් එක්සත් රාජධානිය
05. නුවන් බැල්ලන්තුඩාව මහතා නේවාසික නිත්‍ය නියෝජිත ශ්‍රී ලංකාව
06. රාජා ප්‍රනාන්දුපුල්ලේ මහතා සභාපති ස්වීඩනය
07. සමන්ත වීරමන්ත්‍රී මහතා ලේකම් එක්සත් අරාබි එමීරය රාජ්‍යය
08. රුවන් පෙරේරා මහතා සම සභාපති කැනඩාව
09. විජිත් වික්‍රමසිංහ මහතා උප සභාපති එක්සත් අරාබි එමීරය
10. ශ්‍යාමේන්ද්‍ර වික්‍රමාරච්චි මහතා විධායක අධ්‍යක්ෂක, ශ්‍රී ලංකාව
11. කමල් ලියනගේ මහතා ලේකම් ශ්‍රී ලංකාව

**ජාතික සංවිධාන නියෝජනය කරමින්**

12. මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි - ජාතික මහජන සභාව
13. මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි - ජාතික විද්වත් භික්ෂු සංසදය
14. මහාචාර්ය පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි - ශ්‍රී ලංකා චීන සහයෝගිතා සංගමය
15. ශාස්ත්‍රපති පූජ්‍ය ආචාර්ය හෑගොඩ විපස්සි හිමි ථේරවාද විමර්ශන සභාව
16. පූජ්‍ය දෙහිපේ වන්දවිමල හිමි දේශප්‍රේමී බොදු පදනම
17. පූජ්‍ය අඟුලුගල්ලේ සිරි ජිනානන්ද හිමි - බෞද්ධ තොරතුරු කේන්ද්‍රය
18. කුලතුංග රාජපක්ෂ මහතා සිංහල වීර විදහන සංවිධානය
19. විශ්‍රාමික ලුතිතන් ජනරාල් ජගත් ඩයස් මහතා ශ්‍රී ලංකාව බෙදීමට එරෙහි ව්‍යාපාරය
20. ඩී කේ පී දසනායක මහතා රියර් අද්මිරාල් (විශ්‍රාමික) ඒකීය රාජ්‍යය සහ රණවිරුවන් සුරැකීමේ සංවිධාන එකමුතුව
21. අනුලා විජේසුන්දර මහත්මිය ජයග්‍රහණය කොළඹ සංවිධානය
22. විශ්‍රාමික බ්‍රිගේඩියර් අතුල ද සිල්වා මහතා - ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වූ සංවිධාන එකමුතුව
23. ආචාර්ය කීර්ති ජයසූරිය මහතා - SPUR සංවිධානය ඔස්ට්‍රේලියාව
24. ජ්‍යෙෂ්ඨ නීතිඥ කල්‍යානන්ද තිරාණගම මහතා - විද්වත් උපදේශක
25. ජනාධිපති නීතිඥ මනෝහරද සිල්වා මහතා - විද්වත් උපදේශක
26. නීතිඥ කනිෂ්ක විතාරණ මහතා - විද්වත් උපදේශක
27. ශෙනාලි වඩුගේ මහත්මිය ස්වාධීන දේශපාලන විශ්ලේෂක
28. වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා - දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය
29. කර්නල් අනිල් අමරසේකර මහතා - ජාතික ඒකාබද්ධ කමිටුව
30. වෛද්‍ය ඉන්ද්‍රජිත් කමලදාස මහතා - මහජන රාජ්‍ය සභාව
31. අනුරාධා යහම්පත් මහත්මිය හිටපු නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය
32. නීතිඥ මධුමාලි අල්විස් මහත්මිය - හෙළ කාන්තා බලය
33. නීතිඥ එස්. කේ. ඒ. එස්. සේනානායක මහතා - ජාතික උරුමයන් සුරැකීමේ මධ්‍යස්ථානය
34. අනුරාධ තෙන්නකෝන් මහතා ජාතික - ගොවිජන එකමුතුව
35. ප්‍රියදර්ශන බෙන්තොට ආරච්චි මහතා - ස්වදේශික ජාතික ව්‍යාපාරය
36. වසන්ත අල්විස් මහතා - මහජන යුතුකම් කේන්ද්‍රය
37. වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා - අධිරාජ්‍ය විරෝධී ජාතික සංසදය
38. මතුගම සෙනෙවිරුවන් මහතා ජාතික උරුමයන් සුරැකීමේ සංවිධානය
39. ආචාර්ය වසන්ත පුංචිහේවා මහතා - තිසබ් සංවිධානය
40. හේවාවිතාරණගේ දයානන්ද මහතා - දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය ප්‍රංශ ශාඛාව
41. ආචාර්ය නෙම්සිරි ජයතිලක මහතා - දේශප්‍රේමී ජාතික පෙරමුණ
42. බුද්ධික ද සිල්වා මහතා සාම්ප්‍රදායික පොල්තෙල් නිෂ්පාදකයින්ගේ සංගමය
43. ප්‍රියංගා කොතලාවල මහත්මිය - ලක්මව දියණියෝ සංවිධානය
44. බුද්ධික විමලසිරි මහතා පාවහන් සහ සම්භාණ්ඩ කර්මාන්තකරුවන්ගේ සංසදය
45. ඉංජිනේරු නිමල් තිස්ස විජයතුංග මහතා - දේශප්‍රේමී විද්වත් සංසදය
46. ඉන්දික උබේසේකර මහතා චින්තන පදනම ලංකා වාදය
47. සුනිල් ජයසුන්දර මහතා විනිවිද පදනම
48. වින්දන විදුර කුමාර මහතා සැබෑ ජාතික ව්‍යාපාරය
49. සාලිය හෙට්ටිආරච්චි මහතා ධර්මපාල පරපුර සංවිධානය
50. අජිත් රණසිංහ මහතා එකමුතු භූමිපුත්‍ර පෙරමුණ
51. ජනක බෝධිනන්ද මහතා ජාතික උරුමයන් සුරැකීමේ මහා සම්මේලනය
52. උදිත හේවානායක මහතා ප්‍රජා අභිලාෂයන් සුරක්ෂා පදනම
53. සුනිල් පතිරණ මහතා විදේශ ශ්‍රමික ජාලය
54. ජනක විජයපතිරණ මහතා නිදහස් සේවක සංගමය
55. චාරුක කරුණාරත්න මහතා වෘතීය ඉංජිනේරු සංවිධානය
56. කෝසල පත්තිනිගේ මහතා සසුන සුරැකීමට ගෝලීය සිංහල එකමුතුව
57. ගාමිණී පේදුරු ආරච්චි මහතා - ලංකා ජාතික පෙරමුණ
58. ජීවන්ත ජයතිස්ස මහතා ශ්‍රී ලංකාවේ බොලිවේරියානු සහයෝගීතාවය
59. දුලාජ් මනතුංග මහතා තරුණ පරපුර සංවිධානය
60. අසිනි පෙරේරා මෙනවිය කාන්තා පරපුර සංවිධානය
61. ලහිරු හේරත් මහතා ගොවි ජනපවුර සංවිධානය
62. බන්දුල අතුකෝරාල රණවිරු ජනපවුර

**අනුග්‍රාහය - ගෝලීය සංසදය**